IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
## කොළඹ විශ්වවිද්‍යාලය

## ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් පළපුරුද්ද සහිත පුද්ගලයින්ගෙන් 2023-12-02 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **කථිකාචාර්ය (පරිවාස) / කථිකාචාර්ය (ස්ථිර නොකළ)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/ I ශ්‍රේණිය**
   **විෂය ක්ෂේත්‍රය : ආර්ථික විද්‍යාව, සංචාරක ව්‍යාපාරය සහ භාෂාවන්**

2. **කථිකාචාර්ය (පරිවාස) / කථිකාචාර්ය (ස්ථිර නොකළ)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/ I ශ්‍රේණිය**
   **විෂය ක්ෂේත්‍රය : දේශපාලන විද්‍යාව සහ ඉතිහාසය**

**සටහන :**
**තනතුරු දෙකම ආයතනයේ ශ්‍රම කළමනාකරණ උපාධි පාඨමාලාවේ සිසුන් සඳහා ඉගැන්වීම/උපදෙස් ලබාදීම හා සම්බන්ධ වන අතර, මෙම වැඩසටහනේ උපදේශන මාධ්‍ය සිංහල හා ඉංග්‍රීසි වේ.**

අයදුම්පත් යොමු කිරීම සහ ඊට අදාළ උපදෙස් ලබාගැනීම සඳහා ආයතනයේ (https://www.ihra.cmb.ac.lk/vacancies) වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**සියලුම අයදුම්පත් අදාළ සබැඳිය යටතේ Google ආකෘති පත්‍රය** (Google Form) **සම්පූර්ණ කරමින් ඉදිරිපත් කළ යුතුය.**

අයදුම්පත පිරවීමෙන් අනතුරුව අයදුම්කරු විසින් ලබාගන්නා ලද Google අකෘති පත්‍රයේ PDF දෘඩ පිටපතට (hard copy) අයදුම්කරුගේ අත්සන යොදා ආයතනය වෙත එවීම **අනිවාර්ය වේ.** අයදුම්කරු විසින් ලබාගත් මුල් දෘඩ පිටපතට (PDF) යම් වෙනසක් සිදුකිරීම සහ එම පිටපත ඉදිරිපත් නොකිරීම තෝරාගැනීමේ ක්‍රියාවලියේදී සුදුසුකම් නොලැබී යාමට හේතු වේ. අයදුම්කරු උසස් අධ්‍යාපනික ආයතනයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ රජයේ සංස්ථාවක සේවයේ යෙදී සිටීනම්, ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව අයදුම්පත යොමු කළ යුතුය.

මීට අමතරව අදාළ අධ්‍යාපන සහතික (අනුපිටපත් ද ඇතුළුව) වෘත්තීමය, විෂය බාහිර ක්‍රියාකාරකම්වලට අදාළ සහතික සහ සේවා සහතිකවල සහතික කළ පිටපත් සමඟ ඉහත සදහන් සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි PDF දෘඩ පිටපත මෙම (recruitments@ihra.cmb.ac.lk) විද්‍යුත් ලිපිනයට සහ ලියාපදිංචි තැපෑලෙන් **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ ආයතන, මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, 275, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනය වෙත නියමිත** දිනට හෝ ඊට පෙර එවිය යුතුය.

අයදුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි සඳහන් කළ යුතුය.

**නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**අධ්‍යක්ෂ**
**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

2023.11.12